ලිංගික අපරාධයන්ගේ -විශේෂයෙන්ම බාලවයස් ලිංගික අපරාධයන්ගේ- බරපතල භාවය සැහැල්ලු කොට දක්වන පුවත් සිරස්තල සහ වාර්තාවන් මේ වන විට වැඩි වැඩියෙන් දක්නට ලැබෙනා ප්‍රවණතාවයක් නිරීක්ෂණය කළ හැක. එවැනි ප්‍රවණතාවයක ඇති ගැටළුව වන්නේ, සමාජය මගින් එවැනි අපරාධයන් සුළු කොට තැකීම, ඒ ඔස්සේ එවැනි අපරාධයන්ට වක්‍රාකාරීව අනුබල ලැබීම සහ වින්දිතයන් වෙත දෝෂාරෝපණය එල්ල වීම නොවේදැයි පාඨක අප ඉස්මතු කළ යුතු පැනයයි.
මෙම තත්වයට උදාහරණ ලෙසින් නාවලපිටිය දැරියක අපයෝජනය කිරීමේ සිදුවීම මව්බිම (07/16) සහ ලංකාදීප (07/17) වාර්තා කොට ඇති ආකාරය ගත හැක. මෙහි මව්බිම සිරස්තලයේ එම දැරිය අපයෝජනයට ලක් කළ බවට සැක පිට අත්අඩංගුවට ගත් අයවලුන් "පෙම්වතුන්" බවට ලඝු කොට තිබෙනු දැකිය හැක. එසේම ලංකාදීප සිරස්තලයේ එම අපයෝජනයට සැක පිට "[එම දැරියගේ] පෙවතා සහ පියා ඇතුළු 6 ක් රිමාන්ඩ්" යනුවෙන් දැක්වී ඇත.
මෙම සිරස්තල සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Lankadeepa